**ශ්‍රී ලංකා රග්බි - 2018**

----------------------------------

**1.1 තත්ත්වාගණනය කළ විගණන මතය**

-------------------------------------------

ශ්‍රී ලංකා රග්බිහි ("ශ්‍රී ලංකා රග්බි") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රග්බි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්ව මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා රග්බිහි අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා රග්බි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා රග්බි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ශ්‍රී ලංකා රග්බි කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට ශ්‍රී ලංකා රග්බි පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ශ්‍රී ලංකා රග්බි ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව ශ්‍රී ලංකා රග්බි කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා පාසැල් රග්බි පාපන්දු සංගමයෙන් ලැබිය යුතු මුදල් | 17,492,313 | ලිඛිත ගිවිසුමක් හෝ වෙනත් ආධාරක ලියකියවිලි | සටහන් කර ගන්නා ලදී. මෙම ගැටලුව ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂය පරීක්ෂා කිරීම සඳහා ලැබිය යුතු ශේෂවලට අදාළ ලියකියවිලි ප්‍රමාණවත් පරිදි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු මුදල් | 23,543,737 | ශේෂ සනාථ කිරීම් | සටහන් කර ගන්නා ලදී. මෙම කරුණ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂය පරීක්ෂා කිරීම සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ගෙවිය යුතු මුදල් | 16,047,113 | ශේෂ සනාථ කිරීම් | සටහන් කර ගන්නා ලදී. මෙම කරුණ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂ පිළිබඳ සනාථ කිරීම් ප්‍රමාණවත් පරිදි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | දේපල, පිරියත හා උපකරණ | 7,121,662 | භෞතික සත්‍යාපන වාර්තා | සටහන් කර ගන්නා ලදී. ඉදිරියේදී වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | දේපල, පිරියත හා උපකරණ සඳහා භෞතික සත්‍යාපනය සිදු කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟහිටි එකතුව රු.218,533 ක ලැබිය යුතු ශේෂ 04 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් හිඟ හිටි එකතුව රු.18,974,324 ක් වූ වෙනත් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. විධායක කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද අතර, ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 1 කට වැඩි කාලයක් පැවති එකතුව රු.13,497,205 ක් වූ වෙනත් ගෙවිය යුතු ශේෂ 07 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවති රු.2,603,175 ක් වූ ශේෂයක් නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. ප්‍රමාණවත් අරමුදල් ලැබුණු පසු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් කාලීනව නිරවුල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රග්බි ක්‍රීඩාව වැඩි දියුණු කිරීම සඳහා අත්තිකාරම් ලෙස පළාත් රග්බි සංගම් සඳහා රු.1,109,470 ක්, රු.1,617,242 ක් හා රු.2,938,937 ක් පිළිවෙලින් 2016, 2017 සහ 2018 වර්ෂවලදී ලබා දී තිබුණි. කෙසේ වුවද, එම අත්තිකාරම් 2019 මැයි අවසානය වනවිටත් නිරවුල් කර නොතිබුණි. | 2019 වර්ෂය ඇතුළත අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396(ඇ) | මාස 6 ක් ඉක්මවන ලද රු.192,000 ක් වූ චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | එම චෙක්පත් අවලංගු කිරීම සඳහා කඩිනම් පියවර ගනු ලැබේ. | මාස 6 ක් ඉක්මවූ චෙක්පත් පිළිබඳව කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.28,672,002 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,559,671 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,112,331 ක පිරිහීමක් දැක්වුණි. රු.27,012,067 කින් හා රු.11,102,743 කින් පිළිවෙලින් ආදායම හා අනෙකුත් මෙහෙයුම් වියදම් අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 14.1 (ඒ) හා (ඔ) වගන්තිවලට අනුව, ජාතික පාසල් හා පළාත් පාසල්, රග්බි පාපන්දු සංගමය, ශ්‍රී ලංකා රග්බි පාපන්දු තරඟ තීරක සංගමය හා ශ්‍රී ලංකා පළාත් රග්බි පාපන්දු සමාජ ඇතුලු ශ්‍රී ලංකා රග්බි සාමාජිකයන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී දින 45 ක් ඇතුළත වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් සහතික කරන ලද තම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. තවද, | 2019 වර්ෂයේදී මෙම කරුණු නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාව ප්‍රකාරව කඩිනම් පියවර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| නිල බලයෙන් පත්වූ සියලු නිලධාරීන්ගේ සහ කමිටු සාමාජිකයන්ගේ ජීව දත්ත, කමිටු සටහන්වල සහතික කළ පිටපත් අදාළ මහා සභා රැස්වීමේ පැමිණීමේ ලේඛන, විගණිත මූල්‍ය ප්‍රකාශනවල සහතික කළ පිටපත් ඇතුලු අනෙකුත් ලේඛන සහ එම විගණිත මූල්‍ය ප්‍රකාශන ඔවුන්ගේ මහා සභා රැස්වීමේදී සැලකිල්ලට ගත් බව තහවුරු කිරීම සහ සාමාජිකයින්ගේ ලැයිස්තු සහ තරඟ හා වෙනත් වැඩසටහන් පිළිබඳ විස්තරද ශ්‍රී ලංකා රග්බි වාර්ෂික මහා සභා රැස්වීම් දිනයට මාසයකට පෙර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මෙම අවශ්‍යතාවයන් සඳහා අනුකූලවීමට ශ්‍රී ලංකා රග්බි විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |

**3.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු.85,633 ක් හා රු.108,738 ක් වටිනා වර්ග 13 ක ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා ඇඳුම් පිළිවෙලින් වර්ෂ 02 ක් හා වර්ෂ 04 ක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි. | නිෂ්කාර්ය තොග සඳහා පියවර ගනු ලැබේ. | තොගය කළමනාකරණය සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා රග්බි සඳහා බඳවා ගැනීම් පරිපාටියක් හා සේවක සංඛ්‍යාවක් නොතිබුණි. | බඳවා ගැනීම් හා සේවක සංඛ්‍යාව සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියක් පිළියෙල කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | ඵලදායී මානව සම්පත් කළමනාකරණය සඳහා අනුමත බඳවා ගැනීම් හා සේවක සංඛ්‍යා පරිපාටියක් සකස් කළ යුතු වේ. |